දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා
அமைச்சர்
Minister
2784832
2784807
2785617

ලේකම්
செயலாளர்
Secretary
2784812

කාර්යාලය
அலுவலகம்
Office
2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය
எனது இல.
My No.
ED/01/12/02/06/01

දිනය
திகதி
Date
2013.06.11

මබේ අංකය
உமது இல.
Your No
..............................

# චක්‍රලේඛ අංක : 25/2013

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල්වල ප්‍රධානීන් වෙත,

## අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

සීඝ්‍රයෙන් වෙනස්වන සමාජ අවශ්‍යතාව තුළ නිපුනතාවලින් හෙබි සිසු පරපුරක් අධ්‍යාපනය තුළින් නිර්මාණය කළ යුතුව ඇත. පාසල් සිසුන් තුළ නිපුනතා සංවර්ධනය කිරීමේ අරමුණින් "තාක්ෂණ විෂය ධාරාව " නමින් නව විෂය ධාරාවක් 2013 වර්ෂයේ සිට පාසල් පද්ධතියට හඳුන්වා දෙනු ලැබේ.

02. ඒ අනුව, අ.පො.ස (උ.පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරන චක්‍රලේඛය හා එයට අදාළව නිකුත් කර ඇති 2008.12.31 දිනැති අංක 2008/17 (i), 2009.06.02 දිනැති අංක 2008/17 (ii), 2012.05.03 දිනැති අංක 2012/14 සහ 2013.04.29 දිනැති අංක 2013/04 දරන චක්‍රලේඛ සංශෝධනවලට අමතර වශයෙන් පහත සඳහන් සංශෝධන ද ඇතුළත් කරමි.

03. 2008/17 චක්‍රලේඛයේ 2.5 උප වගන්තියේ "12 වන ශ්‍රේණියේ විෂය ධාරාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්" යටතේ (අ) සහ (ආ) ඡේදවලට අමතරව (ඇ) ඡේදය ද ඇතුළත් කරමි.

2.5
(ඇ) තාක්ෂණ අංශය
තාක්ෂණවේදය විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීම සඳහා අ.පො.ස.(සා.පෙළ) ගණිතය හා විද්‍යාව විෂයයන් සමත් වී තිබිය යුතු ය.

04. ඉහත සඳහන් කරන ලද අතිරේක විධිවිධානවලට අමතරව මෙහි පළමුවන ඡේදයෙහි සඳහන් චක්‍රලේඛවල ඇතුළත් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බල පැවැත්වේ.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

1. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. විභාග කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
8. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. ED/01/12/02/06/01

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

දිනය / திகதி / Date 2013.06.11

තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වන පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

### අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණ විෂය ධාරාව ආරම්භ කිරීම - 2013

අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාවන්ට අදාළ ව නිකුත් කර ඇති අංක 2009/16 දරන චක්‍රලේඛයේ සඳහන් විෂය ධාරාවන් හතරට අමතර ව පස් වැනි විෂය ධාරාව වශයෙන් තාක්ෂණවේදය විෂය ධාරාව, පළමු වන අදියරේ දී මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සහිත තෝරා ගත් පාසල් 200 ක, 2013 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් සඳහා ක්‍රියාත්මක වේ.

02. මෙම විෂය ධාරාව හදාරණ සිසුන් සඳහා පහත සඳහන් පරිදි විෂය සංයෝජන ඉදිරිපත් කෙරේ.

2.1 පහත සඳහන් විෂයන් අනිවාර්යයෙන් තෝරා ගත යුතු ය.

ඉංජිනේරු තාක්ෂණවේදය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය
තාක්ෂණවේදය සඳහා විද්‍යාව

2.2 තුන් වන විෂය පහත දැක්වෙන විෂයන් අතරින් තෝරා ගත යුතු ය.

| | |
|---|---|
| ආර්ථික විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| භූගෝල විද්‍යාව | චිත්‍ර කලාව |
| ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ඉංග්‍රීසි | කෘෂි විද්‍යාව |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ශිල්පීකරණය |

03. ඒ පිළිබඳව සවිස්තරාත්මක චක්‍රලේඛය යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. එතෙක් ඉහත දැක්වෙන පරිදි කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්-

01. සභාපති ,ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
02. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
03. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
04. විභාග කොමසාරිස් ජනරාල්
05. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
06. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරු
07. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
08. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු